## අධිකරණ සේවා කොමිෂන් සභාව

## වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වූ නඩත්තු මණ්ඩලයෙහි සාමාජිකයින් පත්කිරීම - 2022

2011 අංක 05 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම(සංශෝධන) පනතේ 8 වන වගන්තියෙන් සංශෝධනය වී ඇති 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ පනතේ 24 වන වගන්තිය අනුව, වසර 3ක කාලසීමාවකට නඩත්තු මණ්ඩලයක් ස්ථාපිත කිරීමේ කාර්යය සඳහා, පහත සඳහන් ක්ෂේත්‍රයන් පිළිබඳව දැනුම හා පළපුරුද්ද ඇති ප්‍රවීණ, විශ්වසනීය, මනා චරිතයකින් සහ යහපත් සෞඛ්‍ය තත්වයකින් යුතු ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවීමට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

1. නීතිය
2. කළමනාකරණය
3. මානව හිමිකම්
4. සමාජ සේවා
5. වෛද්‍ය වෘත්තිය හෝ උපදේශන

සියලුම අයදුම්පත් **2022.05.06** දින හෝ ඊට පෙර ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ 12 වෙත එවිය යුතුය.

එම පත්කර ගනු ලබන්නා වූ සාමාජික මණ්ඩලයෙහි නිලධාරීන් සඳහා පහත සඳහන් පරිදි දීමනා ගෙවනු ලැබේ

1. සභාපති
   සියලු දීමනා ඇතුලත් මාසික දීමනාව - රු: 35,000/=
2. සාමාජිකයන් සඳහා
   උපරිම දින 05කට යටත්ව දිනකට ගෙවනු ලබන දීමනාව - රු: 5,000/=

එච්. සංජීව සෝමරත්න,
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2022 මාර්තු මස 31 වැනි දින,
කොළඹ 12
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.